# රාජකීය විද්‍යාලය - කොළඹ 7
# අවසාන වාර පරීක්ෂණය - 2007
# ගණිතය 7 වසර
# I කොටස

1. හිස්තැනට සුදුසු වචනය ලියන්න.

   ______________ + ඔත්තේ = ඉරට්ටේ

2. අගය සොයන්න.

   (-6) + 8

3. 48 හි සියලුම සාධක ලියන්න.

4. 20.5 › 1000 අගය සොයන්න.

5. චතුස්තලයක දාර කීයක් තිබේද?

6. 1135h පැය 12 ඔරලෝසු වේලාවෙන් දක්වන්න.

7. "doll" යන වචනයේ අකුරු කුලකය ලියන්න.

8. මෙය කවර වර්ගයේ ටෙසලාකරණයක්ද?

9. $y < 4$ යන අසමානතාවට ගැලපෙන ධන පූර්ණ සංඛ්‍යාමය අගයන් 2 ක් ලියන්න.

10. 25% සරලම භාගයක් සේ ලියන්න.

11. 2:3 = 4: ______ නම් හිස්තැන සඳහා අගය සොයන්න.

12. පැන්සලක දිග 6cm 2mm වේ. එහි දිග නිමානය කරන්න.

13. $(2a)^2$ විහිදුවා ලියන්න.

14. විසි දහස් හතර ඉලක්කමෙන් ලියන්න.

15. 5p + 3 + 2p සුළු කරන්න.

16. 5kg ග්රෑම් වලින් ලියන්න.

17. සුළු කරන්න. $\frac{1}{3} + \frac{1}{6}$

18. 4(a + 2b) වරහන් ඉවත් කර ලියන්න.

19. මාර්ග නීති පිලිපදිමින් ප්‍රවේශමෙන් රිය පදවන අයෙකු අනතුරකට ලක්වීමේ සම්භාවිතාව සඳහා අගය පරාසයක් (0ත් 1ත් අතර) පිරිනමන්න.

20. $ABC = 99^0$ ABC කවර වර්ගයේ කෝණයක්ද?

ප්‍රශ්ණයකට ලකුණු 2 බැගින් 2x 20 = 40

# II පත්‍රය

(01) (i) 942 හි ඉලක්කම් දර්ශකය සොයන්න

(ii) 942, 2න් හා 3න් බෙදීමට හැකිය. එයට හේතුව කුමක්ද?

(iii) පහත දී ඇති සංඛ්‍යා අතුරින් 5 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

32, 50, 78, 85, 90, 101

(iv) 28 = 2x2x7

35 = 5x7

ඉහත සාධක උපකාර කර ගෙන 28 හා 35 යන සංඛ්‍යාවල

(1) මහා පොදු සාධකය හා

(2) කුඩා පොදු ගුණාකාරය සොයන්න.

(02) සිසුන් කිහිපදෙනෙකු ඇගයීමකදී ලබාගත් ලකුණු මෙම වෘත්ත පත්‍ර සටහනේ දැක්වේ.

| වෘත්ත | පත්‍ර |
|---|---|
| 2 | 3 8 |
| 3 | 2 3 5 8 8 |
| 4 | 7 9 |
| 5 | 0 |

මෙම සටහනට අනුව

(i) සිසුවකු ලැබූ අඩුම ලකුණ කීයද?

(ii) සිසුවකු ලැබූ වැඩිම ලකුණ කීයද?

(iii) දෙවන පේලියේ සටහන් වී ඇති ලකුණු මොනවාද?

(iv) 45 ට වැඩියෙන් ලකුණු ගත් සිසුන්ට A සාමාර්ථයක් හිමි වේ. එසේ නම් සිසුන් කී දෙනෙකුට A සාමාර්ථ ලබා ගත හැකිද?

(03) මෙම ඛණ්ඩාංක තලය ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කර ගන්න



(i) මෙම ඛන්ඩාංක තලයේ පිහිටි A හා B ලක්ෂවල ඛන්ඩාංක ලියන්න.

(ii) C = (0,3) ලක්ෂය මෙම ඛන්ඩාංක තලයේ ලකුණු කරන්න

(iii) A, B, C යා කළ විට ලැබෙන රූපය කුමක්ද?

(iv) කැඩි ඉරිවලින් පරාවර්තන රේඛාව දක්වා ඇත. ABC රූපයේ ප්‍රතිබිම්භය ABC ලෙස ඇඳ දක්වන්න.

(04) සෘජුකෝණාස්‍ර ඉඩමක දිග 5m ද පලල 3m ද වේ. ඉඩම වටා 2m පලල පාරක් ඇත.

(i) ඉඩමේ වර්ගඵලය සොයන්න.

(ii) පාර සහිත ඉඩමේ වර්ගඵලය සොයන්න.

(iii) පාරේ වර්ගඵලය සොයන්න.



(05) (i) අරය 5cm වන වෘත්තයක් ඇඳ එහි කේන්ද්‍රය O යයි නම් කරන්න.

(ii) OA අරය වනසේ වෘත්තය මත A ලක්ෂයක් ලකුණු කරන්න.

(iii) AB ජ්‍යායක් වන සේ B ලක්ෂය වෘත්තය මත ලකුණු කරන්න.

(iv) AB ට සමාන්තර රේඛාවක් O හරහා අඳින්න.

(06) (අ) $4x + 5 = 9$

මෙම සමීකරණය සඳහා සිසුවෙකු අඳින ලද ගැලීම් සටහනක් මෙහි
දැක්වේ. එහි හිස්තැන් පුරවන්න.

මෙම සමීකරණය විසඳීම සඳහා ගැලීම් සටහනක් භාවිතා කරන්න.

(ආ) මල්ලී ළඟ මුද්දර x සංඛ්‍යාවක්ද නංගී ළඟ මුද්දර එමෙන් දෙගුණයක් ද ඇත.
දෙදෙනාම ළඟ ඇති මුද්දර සංඛ්‍යාව p නම් p සඳහා සූත්‍රයක් ලියන්න.

(07) (i) පිටි 3kg 725g ක් සහ සීනි 2kg 575g මිශ්‍ර කරන ලදී. මිශ්‍රණයේ බර කොපමණද?

(ii) ක්‍රීඩා සංදර්ශනයකට ඇඳුම් මැසීම සඳහා එක් පාසලකට රෙදි 13m 75 cm අවශ්‍ය වේ.
පාසල් 6 ක් සඳහා අවශ්‍ය රෙදි ප්‍රමාණය සොයන්න.

(iii) 3kg 216g බර කඩල තොගයක් බෑග් 8 කට සමානව දමන ලදී. එක්
බෑගයකට අල්ලන කඩල ප්‍රමාණය සොයන්න.

(08) (i) පහත දැක්වෙන මිශ්‍ර සංඛ්‍යා විෂම භාග ලෙස දක්වන්න.

1. $1\frac{2}{3}$ 2. $5\frac{1}{4}$

(ii) $\frac{3}{5}$ , $\frac{1}{2}$ , $\frac{5}{7}$ ආරෝහණ පටිපාටියට ලියන්න.

(iii) පළතුරු බීම $\frac{5}{6}$ l සෑදීම සඳහා ජලය $\frac{3}{4}$ l යොදා ගෙන ඇත. ඒ සඳහා
භාවිතයට ගෙන ඇති පලතුරු යුෂ ප්‍රමාණය ලීටර වලින් සොයන්න.